# මගේ ලෝකය

## ඇසෙන දැනෙන දේ.. හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

### කතා බහ

කතා බහ ලියන්නේ නැද්දැයි අප හමු වන තැන්හිදී අසන පාඨකයෝ බොහෝ වෙති. සෙරෙන්ඩිබ් නිව්ස් පුවත් පතෙන් ආරම්භ කර පහන පසුකර සන්නසට ආ කතා බහ වැනි ඉතා ජනප්‍රිය වූ කොළමක් නවතා දැම්මේ ඇයිදැයි යන පැනයට පැහැදිලි පිළිතුරක් මා ළඟ නැත. පුවත්පතේ ඉඩ මදි වන විට ඒ ලිපිය ඉවත් කරගැනීමට සිදුවීමත්, අනෙක් අතින් වෙනත් මුහුණුවරකින් වුව ද ''සංක්‍රමණිකයාගේ සටහන'' ලියන ලේඛකයා අතින් කතා බහෙන් ඉටු වූ කාරියට සමාන සේවයක් ඉටුවීමත් යන කාරණා නිසා නැවත කතා බහ අරඹන්නට මම නොසිතුවෙමි.

කතා බහ ලිවීම අපට අපූරු අත්දැකීම් රැසක් ගෙන දුන්නේ ය. බොහෝ අය ඒ සටහන් බලා රසයක් විඳගත් අතර ඒවායින් රිදුම් ලද ඇත්තන් ද ඉඳ හිට මට කතා කළ බව මතකය. ඒ අතර කතා බහේ ලියන්නැයි කියමින් තමන්ගේ පවුල්වල පුද්ගලික ප්‍රශ්න වල සිට සමාජයේ දැවෙන ප්‍රශ්න දක්වා සියලු කරුණු කාරණා මට දුරකථනයෙන් දැනුම් දුන් විශාල පිරිසක් ද වූහ.

මේ සියලු අත්දැකීම් අතරින් වඩාත්ම හදවතට දැනුණ අත්දැකීම නම් ලංකාවේ වෙසෙන සංගීතඥ රෝහණ ධර්මකීර්ති හිතවතා ඔස්ට්‍රේලියාවේ දී හමුවූ විටෙක කතා බහ ගැන කළ සඳහනයි.

''මං කතා බහ හැමදාම කියවනවා. ඒ සටහන් වල තියෙන හාස්‍ය රසයට යටින් ඔයා අදහස් කළ දේ මට තේරෙනවා'' ඔහු මතකයෙන් කතා බහේ සටහන් රැසක් කියාගෙන ගියේ ය. ''මම මේ කතා මා එක්ක ලංකාවෙ ඉන්න මිනිස්සු එක්කත් බෙදාගෙන තියෙනවා.'' රෝහණ කී හැටි තවමත් මතකය.

ලේඛකයකුට එයට වඩා සම්මානයක් ඇවැසි ද?

### ලංකා ගමන

කලකට පසුව හදිසියේම සති දෙකකට ලංකාවට ගිය ගමන බොහෝ දේ පිලිබඳව නැවත සිතා බලන්නට අප පොළඹවන ලද ඉසිඹුවක් විය. මේ ගමන ගැන සටහන් රැසක් ලිවිය හැකි වුව ද සටහනක් දෙකක් පමණක් ලියන්නට සිතුවෙමි.

ලංකාවේ එක්තරා ප්‍රසිද්ධ මාධ්‍ය ආයතනයක හිතවතෙකු සමඟ මම ජනමාධ්‍ය පිළිබඳ කතාවක නියැලී සිටියෙමි.

''දැන් දැන් හරසුන් රේඩියෝ නාලිකා වලින් මිනිස් සු ඈත් වෙන්න පටන් අරන්'' ඔහු කීවේ ය. ''මිනි ස්සු හරවත් දේ හොයා යන්න පටන් අරන්. දැන් අර නාලිකා වලටත් හරවත් විදියට වැඩසටහන් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පෙනී යන කාලයක් මේ'

''අහන්නත් සන්තෝසයි'' මම කීවෙමි. මේ අපේ අනාගතය පිළිබඳ අසන්නට ලැබුණු සුබදායක කතාවකි. ඉහළ රස වින්දනයක සුවඳ සොයා යන ගමනකි. මහ ජනතාවට අවැසි නම් ජනමාධ්‍යය වුවද වෙනස් කළ හැකි බවට අනාවැකියකි.
ලෝකය අනික් පැත්තට කැරකෙන යුගයක මෙවැනි දේ අසන්නට ලැබීමත් සතුටකි.

### සාද සංගීතය

ලංකාවේ සිටි කෙටි කාලය තුළ මගේ ඥාති සොයුරෙකුගේ විවාහ මංගල්ලයකට සහභාගි වීමි.

උත්සවය පැවති ශාලාවේ කෙළවරක වාදක කණ්ඩායමකි. ඔවුහු ගී ගැයූ හ. සංගීත භාණ්ඩ වාදනය කළ හ. ඉතා සිහින් හඬකින් ශාලාව පුරා ගලා ගිය ඒ සංගීත නාදය සිතට මිහිරක් ම විය. අමුත්තෝ සතුටු සාමීචියේ යෙදුනහ. විහිලු තහලු කර ගත්හ. අර සිහින් මියුරු සංගීතය ඒ සුහද කතා බහට කිසිම ලෙසකින් බාධාවක් නොවී ය.

සාද වල ඝෝෂා මවන සංගීත කණ්ඩායම් මේ සොඳුරු මොහොත දුටුවා නම්...

### ආචාර්ය තිස්ස අබේසේකර

ශ්‍රී ලාංකේය බුද්ධිමතුන් අතර කැපී පෙනෙන තිස්ස අබේසේකර ශූරීන් ආචාර්ය උපාධියකින් පුදන්නට කොළඹ විශ්ව විද්‍යාලයය ගෙන ඇති තීරණය අපේ මහත් සතුටට හේතුවෙයි. තිස්ස අබේසෙ-කර යනු කලාකරුවෙක් පමණක් නොවේ. අති විශාල දැනුම් සම්භාරයක් හිසේ දරාගත් ඒ දැනුම අන් අය සමඟ බෙදා ගන්නට මනා සේ පොහොසත් සිංහල හා ඉංග්‍රීසි භාෂා ඥානයක් සහිත ප්‍රාඥයෙකි.

මෙයට වසර කීපයකට පෙර තිස්ස අබේසේකර ශූරීන් ශාස්ත්‍රපති උපාධියකට පෙනී සිටීම සඳහා කැළණිය විශ්ව විද්‍යාලයයට දැමූ ඉල්ලුම් පත්‍රය ඒ විශ්ව විද්‍යාලයයේ බක පණ්ඩිතයන් විසින් ප්‍රතික්ෂෙප කළේ ඔහුට පළමු උපාධියක් නැතැයි යන කාරණය පෙරට ගනිමිනි.

පළමු උපාධියක් සඳහා උසස් පෙළ සමත් විය යුතුය ශාස්ත්‍රපති උපාධියක් සඳහා පළමු උපාධියක් තිබිය යුතුය යන සූත්‍රය නූතන ලෝකය තුළ තව දුරටත් වලංගු නැති බව මේ උත්තමයන් නොදත් බැවින් තිස්ස ට සිය ඉල්ලුම් පත්‍රය අකුලා ගන්නට සිදු වූ බව පුවත් පවත් වල කියවීමි. ඒ තිස්ස අබේසේකර ට කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධියක් පිරිනැමීම සතුටට කාරණයක් නොවන්නේ කෙසේ ද?

### මාරක කතා චක්‍රවර්ති ඩීමන් ආනන්ද

ඒ නම එක් යුගයක දෙමාපියන් තුළ අති මහත් භීතියක් ඇති කළ නමක් වූ බව මම දනිමි. ඔහු ලියූ මාරක කතා කියවීම අපට තහනම් වූයේ එනිසා විය යුතුය. බොහෝ දරුවන් ඩීමන් ආනන්දගේ මාරක කතා කියෙව්වේ දෙමාපියන්ට හොරෙනි.

අපේ ආච්චිගේ නංගී (අපි ඇයට කීවේ පුංචි ආච්චි කියා ය) සතුව යකඩ ට්‍රන්ක් පෙට්ටියක් පුරවා ඩීමන් ආනන්ද ඇතුළු තවත් ලේඛකයන ගේ කතා පොත් තිබුණි. පොත් වලට මහත් සේ ඇලුම් කළ පුංචි ආච්චි ඒවා අල්ලන්නටවත් අපට ඉඩක් නොදුන්නා ය.

තහංචි වැටෙන විට තහංචි කඩන්නට පෙළඹීම ස්වභාවික ය. අපි පුංචි ආච්චි ගෙදර නැති වන වේලාවල් බලා ඇගේ නිවසට හොරෙන් ඇතුලු වී ඇගේ පොත් පෙට්ටියෙන් පොත් හොරකම් කර ගන්නටත් ඒවා කියවා ඇය එන්නට පෙර නැවත ඇගේ පෙට්ටියට දමන්නටත් පුරුදු ව සිටියෙමු. ඒ පෙට්ටියේ වූ හාර පන්සීයක් පමණ පොත් අපි ඉතා කුඩා කාලයක් තුළ කියවා අවසන් කළ බව මට මතක ය.

මේ අතුරු කතාව කිව්වේ ඩීමන් ආනන්ද ගැන යමක් කියන්නට ය. කියවීමේ පිස්සුව අප තුළ ඇති කරන්නට පුංචි ආච්චිගේ පොත් පෙට්ටියෙන් සොරා ගෙන කියවූ ඩීමන් ආනන්ද ගේ පිටු හැත්තෑ දෙකේ මාරක කතා කළ සේවය අපමණ ය. ත්‍රාසයත් ශෘංගාරයත් අඩු නොකර පොත් ලියූ ඩීමන් ආනන්ද ගේ භාෂාව අද ව්‍යාකරණ අමු අමුවේ මරමින් පොත් ලියන අපේ බොහෝ ලේඛක ලේඛිකාවන ගේ බස හා සසඳන කල බොහෝ ඉදිරියෙන් වූ බව මට මතක ය.

ඩීමන් ආනන්ද පිළිබඳව ලිපියක් සන්නසේ පළ කරන්නට මගේ සිතේ විශාල කැමැත්තක් විය. ලංකාවට ගිය වේලාවේ දී රස ප්‍රකාශණ කර්තෘ මණ්ඩල ප්‍රධානී කරුණාරත්න ඩී පිලිප් මහතා මට හඳුන්වා දුන්නේ දයාවංශ ජයකොඩි මහතා ය. රස ප්‍රකාශණ කාර්යාලයට එන්නැයි පිලිප් මහතා ආරාධනා කළේ ය. ඒ අනුව පසු දිනෙක අපි රස ප්‍රකාශණ කාර්යාලයේ දී හමුවුණෙමු. ආ ගිය කතා බහේදී ඩීමන් ආනන්ද පිලිබඳ කතාවට ද අපි පිවිසුණෙමු.

''ඩීමන් ආනන්ද මගේ හොඳ හිතවතෙක්.. අපි දැන්මම එයාට කතා කරමු'' පිලිප් මහතා ඒ මොහොතේම දුරකතනයෙන් ඩීමන් ආනන්ද මහතා ඇමතුවේ ය. මා හඳුන්වා දී රිසීවරය මට දුන්නේ ය.

සිය ප්‍රභාමත් යුගයේ දී මහත් ගැරහුම් මැද සිංහල පාඨකයනට සුවිශාල සේවයක් කළ ඩීමන් ආනන්ද නම් වන ලේඛකයා සමඟ කළ ඒ කතාව මගේ මතකයෙන් කිසිදා බැහැර නොවන බව සහතික ය. ඔහු ගේ කටහඬෙහි වූ සතුට අපමණ ය. සන්නස වෙනුවෙන් සාකච්ඡාවකට එක්-වන්නට ඔහු ඉතා උද්යෝගිමත්ව කැමැත්ත පළ කළේ ය. ඒ වෙනුවෙන් ඉක්මනින් ක්‍රියාත්මක වන පොරොන්දුව පිට මම සමුගත්තෙමි.

''ඩීමන් ආනන්ද මහත්තයා දැන් ලෙඩ ගානෙ ඉන්නෙ'' කරුණාරත්න ඩී පිලිප් මහතා මා සමඟ කිවේ ය. ඈ සඟරාවේ සංස්කාරක ධනුජය සේනානායක සොහො-යුරා සමඟ ද සාකච්ඡා කර මා පිටව ආවේ ඉක්මණින් ඩීමන් ආනන්ද පිළිබඳ ලිපිය සකස් කරන්නෙමැයි යන අදිටන ඇතිව ය.

රාවයේ රුවන් කේ කළුආරච්චි තරුණ ලේඛකයා මා වෙනුවෙන් ඩීමන් ආනන්ද මහතා සමඟ සාකච්ඡා කරන්නට කැමැති වූයේ ය. අවාසනාවට ඒ සාකච්ඡාව කෙරෙන්නට පෙර ම ඩීමන් ආනන්ද අප අතරින් වෙන්ව ගියේ ය.

ඉටු කරගන්නට නොහැකි වූ බලාපොරොත්තුවක වේදනාවක් හදවතේ කොණක සැඟව ගත්තේ ය.

## මසුරන් කියමන්

**ප්‍රශ්නය**

මීට ඉහත දී ඔබ ප්‍රකාශ කොට තිබුණා කලාකරුවාගේ වගකීම ප්‍රශ්න පෙන්වා දීම මිස ඊට විසඳුම් ඉදිරිපත් කිරීම නොවන බව. ඔබ එසේ ප්‍රකාශ කළත්, අප කැමතියි ඔබ පෙන්වාදී තිබෙන ප්‍රශ්නයට, ඔබ යෝජනා කරන විසඳුම කුමක්ද කියලා දැනගැනීමට.

**පිළිතුර - වසන්ත ඔබේසේකර - ප්‍රවීණ සිනමා අධ්‍යක්ෂ**

මම කලිනුත් ප්‍රකාශ කළා අප විසින් ප්‍රතිනිර්මාණ කරන්නේ සමාජ සංස්ථාව තුළ තිබෙන ප්‍රශ්න බව. එය අපගේ ආධ්‍යත්මික ප්‍රකාශනයක්. එම ප්‍රතිනිර්මාණය නිසි ලෙස සිද්ධ වී තිබෙනවාද, එය නිසි ලෙස දැනෙනවාද කියන එක ප්‍රේක්ෂකයා විසින් තීරණය කළ යුතු දෙයක්.

ඔස්කා වයිල්ඩ් ප්‍රකාශ කොට තිබෙනවා කලාකරුවා ප්‍රේකෂකයා මෙහෙයවන බවත්, ප්‍රේකෂකයා කලාකරුවා මෙහෙයවීමක් නොකරන බවත්. එයින් මම පණිවුඩ දීමක් පිළිබඳව අදහස් කරන්නේ නැහැ.
කලා කෘතියක් නිර්'මාණය කිරීමෙන් අප සිදු කරන්නේ මට දැනෙන ආධ්‍යාත්මික ආවේගයන් අවංකව ප්‍රකාශ කිරීමක්. ඒ තුළින් තමන්ගේම ආධ්‍යාත්මය දෙස ආපසු හැරී බැලීමට පෙළඹෙනවා නම් එය ලොකු දෙයක්.

උපුටාගැන්ම - දිවයින 2007 ජූලි 13

කෙතරම් ඔපමට්ටම් කළත්
යකඩ රත්තරං වේද??
*දමිළ ප්‍රස්ථා පිරුළක්*